# දේශීය ලොකුළූණු ගොවියා රැකගැනීම

## (2011 යල කන්නය පිළිබඳ විශ්ලේෂණාත්මක විවරණයක්...)

ජාතික දේශපාලන කරලිය තුළ මහත් ආන්දෝලනාත්මක ගැටළුවක් ලෙස දේශීය ලොකුළූණු අලෙවියේ දී මතුවන ගැටළු හඳුනාගත හැකි අතර යල කන්නය තුළ දේශීය ලොකුළූණු අස්වැන්න ආශ්‍රිත වෙළෙඳපොළ තත්ත්වයන් පිළිබඳ විවරණයක යෙදීම මෙම ලිපියේ අරමුණ වේ. මෙරට වාර්ෂික ලොකුළූණු අවශ්‍යතාවය මෙ.ටො.2,25,000ක් පමණ වන අතර සාමාන්‍ය මාසික අවශ්‍යතාවය මෙ.ටො. 18,500ක් පමණ වේ. කෙසේ වුව ද, දේශීය ලොකුළූණු අවශ්‍යතාවයෙන් 70%ක් පමණ මෙරටට ආනයනය කරනු ලබන අතර පසුගිය දශකය තුළ වාර්තා වූ උපරිම ආනයන වියදම වූ රු. දස ලක්ෂ 6800ක පමණ ප්‍රමාණය 2010 වසර තුළ වාර්තා විය. එය අත්‍යවශ්‍ය ආහාර බෝගයක් සඳහා වැය කරනු ලබන සැලකිය යුතු මුදලකි. ඉන්දියාව සහ පාකිස්ථානය මෙරට ප්‍රධාන ආනයනික සැපයුම් රටවල් වන අතර ආනයනයන්ගෙන් 75%ක් පමණ ඉන්දියාවෙන් ආනයනය කෙරේ. මෙම තත්ත්වය තුළ, මෙම රටවල් වලට බලපාන ආර්ථික මෙන් ම කාලගුණික විපර්යාසයන් මෙරට වෙළෙඳපොළට සෘජු බලපෑමක් ඇති කරයි. ඒ තුළ දේශීය ගොවියා රැකගෙන දේශීය නිෂ්පාදනය ඉහළ දැමීමේ වැදගත්කම මනාව පසක් වේ. පසුගිය 2010 වසරේ නොවැම්බර් මස සිට මෙම වසරේ (2011) පෙබරවාරි දක්වා ලොකුළූණු මිල සැළකිය යුතු ලෙස ඉහළයාම එකී කාරණය මනාව අවධාරණය කරයි. එනම්, ඉන්දියාවේ ලොකුළූණු නිෂ්පාදනය කරනු ලබන ප්‍රදේශයන් හි පැවති අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් එරට අපේක්ෂිත නිෂ්පාදනය අඩුවීම එරට මිල ඉහළයාමට හේතු වූ අතර එහි ප්‍රතිඵලය වූයේ ඉන්දියාව ලොකුළූණු අපනයනය තාවකාලිකව මාස 1 1/2කට පමණ සීමා කිරීමයි. එය මෙරට වෙළෙඳපොළට කොතෙක් දුරට බලපෑවේද යන්න විමසා බැලිය යුතු කරුණකි. එනම්, සැප්තැම්බර් මස තුළ පැවති ලොකු ළූණු කිලෝවක සාමාන්‍ය ආනයනික මිල රු.34.00, දෙසැම්බර් වන විට රු.100.00 ඉක්ම වූ අතර එය මෙරට සිල්ලර මිල කිලෝවකට 200.00 ඉක්මවීමට හේතු විය.

2010 ආනයනය කරන ලද ලොකුළූණු සඳහා වාර්තා වූ උපරිම මිල වූ රුපියල් දශලක්ෂ 1300ක පමණ ප්‍රමාණය දෙසැම්බර් මාසය තුළ වාර්තා වූ අතර එය නොවැම්බර් මස දශලක්ෂ 936ක් පමණ විය. මෙම මාසය තුළ පාකිස්ථානයෙන් ඉහළ තොගයක් ආනයනය කෙරිණි. මෙවැනි අනපේක්ෂිත තත්ත්වයන් හමුවේ දේශීය ගොවියා ආරක්ෂා කර ගනිමින් දේශීය නිෂ්පාදනය ඉහළ දැමීමට කටයුතු කළ යුතු වේ. මේ සඳහා දේශීය අස්වනු ලැබෙන විට රජය බදු අනුපාතය ඉහළ දමා ආනයනික සැපයුම පාලනය කොට දේශීය නිෂ්පාදනයෙ හි මිල සැලකිය යුතු ලෙස පහළ නො යෑමට කටයුතු කළ යුතු ව ඇත. 2011 සැප්තැම්බර් මස තුළදී ලොකුළූණු අපනයනය ඉන්දියාව විසින් මුළුමනින්ම නවතා දමන ලදී, ඉන්දියාව තුළ පැවති අයහපත් කාලගුණික තත්ත්වයත් සමග දේශීය ඉල්ලුමට ප්‍රමාණවත් සැපයුමක් නො පැවතීම හේතුවෙන් එරට ආහාර මිල ඉහළ යාම මෙසේ අපනයන තහනම් කිරීමට හේතු විය. මෙවන් අවස්ථාවක දේශීය වශයෙන් ප්‍රමාණවත් සැපයුමක් නො තිබුනේ නම් මිල ඉහළ යාම අනිවාර්යයෙන්ම සිදුවන්නට තිබුණි. එසේ වුව ද, ප්‍රමාණවත් දේශීය සැපයුමක් පැවතීම හේතුවෙන් එසේ නොවීය.

මෙරට ලොකුළූණු වගාව ප්‍රධාන වශයෙන් යල කන්නයට පමණක් සීමා වී ඇති අතර මහ කන්නය තුළ ඉතා සුළු වශයෙන් වගාව සිදු වේ. එය යල කන්නය තුළ අවශ්‍ය බීජ අවශ්‍යතාවයට භාවිතා කරනු ලැබේ. මෙය දේශීය බීජ අවශ්‍යතාවයෙන් සුළු ප්‍රමාණයකි. විශේෂයෙන් මෙරට ලොකුළූණු වගාවෙන් 90%ක් ම මාතලේ දිස්ත්‍රික්කය තුළින් නිෂ්පාදනය කෙරෙන අතර ඉතිරි 10% මහවැලි එච් කලාපය (තඹුත්තේගම) සහ අනුරාධපුරය දිස්ත්‍රික්කයෙන් නිෂ්පාදනය වේ. මාතලේ දිස්ත්‍රික්කය තුළ මහ කන්නයේ වී වගාව සඳහා යොදා ගන්නා කුඹුරු බොහොමයක් යල කන්නය (2011) තුළ ලොකුළූණු වගාව සඳහා යොදා ගැනේ. ක්ෂේත්‍ර තොරතුරු වලට අනුව මෙවර යල කන්නයේ මාතලේ දිස්ත්‍රික්කය තුළ හෙක්. 2679ක් පමණ වගාකොට ඇති අතර අපේක්ෂිත නිෂ්පාදනය මෙ.ටො. 500,00 පමණ වේ. මෙම නිෂ්පාදනයෙන් 50%ක් ම සැප්තැම්බර් මස වෙළෙඳපොළට ලැබීමට නියමිත ය. දඹුල්ල සහ සීගිරිය ගොවිජන සේවා බලප්‍රදේශය තුළින් පමණක් මෙ.ටො. 32,000ක් පමණ අපේක්ෂා කෙරේ. අනුරාධපුරය සහ මහවැලි එච් කලාපයන් ද සහිත එනම්, මුළු වගා බිම් ප්‍රමාණය හෙක්. 3800ක් පමණ වන අතර අපේක්ෂිත මුළු නිෂ්පාදනය මෙ.ටො.68,000ක් පමණ විය හැකි ය. මෙම සාමාන්‍ය වාර්ෂික අවශ්‍යතාවයෙන් මාස 3 1/2 ක පමණ ප්‍රමාණයකි. මෙම අස්වැන්න 20%ක් අගෝස්තු මාසයේ ද 50%ක් ම සැප්තැම්බර් මාසයේ ද ඉතිරි 30% ඔක්තෝබර් මාසයේද අස්වනු නෙලීමට අපේක්ෂිත ය.

මෙරට සාමාන්‍ය මාසික ලොකුළූණු අවශ්‍යතාවයෙන් 50%ක් පමණ අගෝස්තු මස අස්වනු නෙලා වෙළෙඳපොළට ලැබීමට නියමිත ය. සැප්තැම්බර් මස තුළ පමණක් මිල මට්ටම පහළයාම අනිවාර්යයෙන් සිදුවන්නකි. ඊට හේතු වන්නේ සාමාන්‍ය මාසික අවශ්‍යතාවය ලොකුළූණු මෙ.ටො.18,500ක් පමණ වන බැවින් ඉල්ලුමට වඩා සැපයුම ඉහළ තත්ත්වයක පැවතීමයි. ඒ අනුව, ගොවීන් තම අස්වනු එකවර වෙළෙඳපොළට මුදාහැරීම සිදුනොකළ යුත්තකි. දේශීය බීජ වගාකර අස්වනු අපෙක්ෂිත ගොවීන් තම නිෂ්පාදන අවම වශයෙන් ඔක්තෝබර්, නොවැම්බර් මස තෙක් ගබඩා කර ක්‍රමානුකූලව වෙළෙඳපොළට මුදාහැරීමට කටයුතු

කළයුතු වේ. එනම්, රාජ්‍ය මට්ටමෙන්, ලොකුළූණු සඳහා බදු අයකර ආනයන සීමා කළ ද මාසික අවශ්‍යතාවයට, වඩා එකවර වෙළෙඳපොළට සැපයීම මිල අඩුවීමට හේතුවන බැවිනි. එසේම, දේශීයව පවතින අනෙක් අභියෝගය නම් පෙර වසරවලට සාපේක්ෂව දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට දෛනිකව යාපනය ප්‍රදේශයෙන් සැපයෙන රතුළූණු ප්‍රමාණයයි. එය දිනකට කිලෝ 30,000 - 40,000ක් පමණ වේ. මෙම තත්ත්වය සැප්තැම්බර් මස තෙක් පැවති අතර එහි තොග මිල මට්ටම රු.40.00 - 45.00 දක්වා පහත විය. ඉහළ ලොකුළූණු සැපයුමක් පැවතීමත් සමග රතුළූණු සැපයුම ද ඉහළයාම ලොකුළූණු මිල පෙර වසර වලට වඩා සාපේක්ෂව අඩු වීමට හේතු විය හැකි ය. දේශීය ලොකුළූණු ගොවියා මෙම අභියෝගයන්ට ද මුහුණ දිය යුතු ය. මෙවර යල් කන්නය තුළ මාතලේ දිස්ත්‍රික්කයේ හෙක්. 3500ක් පමණ ලොකු ළූණු වගා කිරීමට අපේක්ෂා කළ අතර ජූලි මස අවසන් වන විට හෙක්ටයාර් 2679ක් පමණ වගාකොට අවසන්ව ඇත. මෙම වගා ප්‍රගතිය පසුගිය යල කන්නයට සාපේක්ෂව 8.2%ක පමණ ඉහළ යාමකි.

විශේෂයෙන් නාඋල, ලග්ගල කලාපයන් හි දේශීය බීජ භාවිතා කොට වගා කටයුතු බහුලව සිදු වී තිබේ. එසේ වුව ද, පෙර වසරවලට සාපේක්ෂව දඹුල්ල, සීගිරිය සහ දේවහුව යන ප්‍රදේශයන් හි වගා කටයුතු පසුගිය යල කන්නයට සාපේක්ෂව අඩු වී තිබුණි. කන්නය ආරම්භයේ දී ආනයනික බීජ වෙළෙඳපොළ තුළ හිඟවීමත්, තවාන් කටයුතු වර්ෂාවෙන් විනාශවීමත් සහ පැවති අයහපත් කාළගුණයත් හේතුවෙන් දේශීය බීජ නිෂ්පාදනය 50%කින් පමණ පහළ යාමත් වගා ප්‍රගතිය අඩුවීමට හේතු විය.

දේශීය නිෂ්පාදනය සිදුකිරීමට බීජ පිළිබඳ ප්‍රධාන ගැටළුවක් පවතී. එනම්, දේශීය බීජ හිඟතාවය හේතුවෙන් තත්ත්වයෙන් ඉහළ අස්වනු කල්තබා ගතහැකි මට්ටමේ උසස් බීජ වෙළෙඳපොළ තුළ ලබාගැනීමට නොමැති වීම ය. එහි ප්‍රතිඵලය තත්ත්වයෙන් අඩු ආනයනික බීජ වගාකොට ලබා ගන්නා නිෂ්පාදනය කල් තබාගත නොහැකි වීම යි. එසේ වුව ද, දේශීය බීජ වගා කොට ලබාගන්නා අස්වැන්න මාස 05ක් පමණ වුව ද, කල්තබා ගත හැකි ය. මෙම තත්ත්වයන් හමුවේ කිලෝවක් සඳහා රු.32.00ක පමණ නිෂ්පාදන වියදමක් වැයවීම හේතුවෙන් ගොවියාට අවම රු.40.00-50.00ක පමණ මිලක් ලැබිය යුතු ය. එවිට පාරිභෝගිකයාට ද කිලෝවක් රු.60.00කට අඩු මිලකට ලබාගැනීමට හැකි වේ. මෙම කන්නය තුළ දේශීය ලොකුළූණු ගොවියාට ප්‍රමාණවත් මිලක් ලැබෙමින් පවතී.

ඒ සඳහා රාජ්‍ය මට්ටමෙන් බදු අනුපාතය 2011.08.12 දින සිට කිලෝවක් සඳහා පැවති රු.10.00 ක මිල රු.25.00 දක්වා ඉහළ දැමීම හේතු විය. එවිට, වෙළෙඳපොළ ආනයනික ලොකුළූණු තොග මිල රු.60.00ක් පමණ වූ අතර දේශීය ලොකුළූණු මිල මට්ටම ද ඒ ආසන්නයට පත්විය. එසේම, දේශීය බීජ නිෂ්පාදනය කොට ඇති ගොවීන් තම අස්වනු හැකි තරම් කල්තබා ගැනීමට කටයුතු කොට ඇත. එනම්, වසර අවසන් මාස කිහිපය තුළ මිල මට්ටම ඉහළයාම අනිවාර්යයෙන් සිදුවන්නක් බැවිනි. කෙසේ වුව ද, සියළු තත්ත්වයන් කාළගුණ තත්ත්වය හමුවේ වෙනස්වීමට ඉඩ පැවතිය ද මෙවර යහපත් කාලගුණික තත්ත්වයක් අපේක්ෂිත ය. එනම්, වැසි ලැබීම සිදුවේනම් ගොවීන් තම අස්වනු එකවර නෙළීමට සිදුවන බැවින් මිල පහළ යාම ද සිදුවන බැවිනි. එවිට තත්ත්වයෙන් ඉහළ ලොකුළූණු අපේක්ෂා කළ නොහැකි වන අතර මිල මට්ටම ද අඩුවීම අනිවාර්යයෙන්ම සිදුවන්නක් ද බැවිනි.

වගු අංක - 01

### ලොකුළූණු ආනයනික ප්‍රමාණය සහ මිල ගණන් (2010-2011)

| වර්ෂය සහ මාසය | ආනයනික ප්‍රමාණය මෙ.ටො. | ආනයනික මිල කි.ග්‍රෑ (රු) | වෙළෙඳපොළ | |
|---|---|---|---|---|
| | | | තොග මිල රු. | සිල්ලර මිල කි.ග්‍රෑ.රු. |
| 2010 | | | | |
| ජනවාරි | 15458 | 47.74 | 69.25 | 90.74 |
| පෙබරවාරි | 15364 | 49.86 | 53.43 | 75.83 |
| මාර්තු | 18834 | 44.76 | 45.08 | 61.34 |
| අප්‍රේල් | 17983 | 29.76 | 47.33 | 62.72 |
| මැයි | 14606 | 22.95 | 36.81 | 55.28 |
| ජූනි | 20004 | 25.50 | 57.62 | 72.21 |
| ජූලි | 15775 | 25.21 | 39.05 | 57.51 |
| අගෝස්තු | 8412 | 26.76 | 65.12 | 77.50 |
| සැප්තැම්බර් | 4043 | 33.75 | 53.29 | 75.62 |
| ඔක්තෝබර් | 1761 | 49.78 | 72.97 | 106 |
| නොවැම්බර් | 13168 | 71.05 | 102.30 | 127.34 |
| දෙසැම්බර් | 15583 | 83.53 | 130.55 | 162.52 |
| 2011 | | | | |
| ජනවාරි | 20746 | 67.59 | 88.57 | 121.27 |
| පෙබරවාරි | 14549 | 48.50 | 65.01 | 85.57 |
| මාර්තු | 26357 | 45.70 | 44.05 | 68.76 |
| අප්‍රේල් | 14804 | 25.40 | 43.08 | 59.82 |
| මැයි | 20816 | 23.78 | 40.35 | 59.26 |
| ජූනි | 18249 | 25.10 | 39.94 | 57.83 |
| ජූලි | 18094 | 26.81 | 43.64 | 61.71 |
| අගෝස්තු | 9480 | 29.28 | 62.44 | 82.45 |
| සැප්තැම්බර් | 358 | 28.54 | 47.24 | 83.35 |

**ඩබ්.එච්. දුමින්ද ප්‍රියදර්ශන**

*පර්යේෂණ නිලධාරි*

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය